
# සිගිතිගේ කුරුලු ලැල්ල



හසඳි තෙනාරා ගුණරත්න

# සිඟිතිගේ කුරුළු ලැල්ල

හසඳි තෙනාරා ගුණරත්න

සිඟිතිගේ කුරුළු ලෑල්ල

© හසඳි තෙනාරා ගුණරත්න
මහාමායා බාලිකා විදුහල
5 ශ්‍රේණිය E
2025.02.08

ISBN 978 - 624 - 208 - 773 - 3

පිදුම

*මා හට අකුරු කියාදී*

*යහමග පෙන්වූ*

*ගුරු මෑණිවරුන්ට සහ ගුරු පියවරුන්ට*

*ආදරයෙන්*

*පුදමි.*

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. පිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර.

එකමත් එක රටක ලස්සන ගැහැණු ළමයෙක් හිටියා. එයාගේ නම සිඟිති.එයා හරිම ලස්සනයි. ඒ වගේම කරුණාවන්ත ගැහැණු ළමයෙක්.



සිඟිතිගේ අම්මයි තාත්තයි සිඟිතිට ගොඩක් ආදරේ කරා. සිඟිති එයාගේ අම්මයි,තාත්තයි එක්කයි සතුටින් ජීවත් වුණා.



සිඟිති හරිම ආසයි කුරුල්ලන්ට. මුළු විවේක කාලයම ගත කළේ කුරුල්ලන් ගැන ඉගෙන ගන්න එක තමයි. සිඟිතිගේ විනෝදාංශය වුණේ.



දවසක් පිංකිගේ මිදුලේ සෙල්ලම් කරන විට කිචි බිචි කීචි බීචි කියලා ශබ්දයක් ඇහුණා.




සිඟිති අඹ ගහ දිහා බැලුවා.කුරුලු අම්මා පේන්න හිටියේ නෑ. කුරුලු අම්මා නැතිව කුරුලු පැටවු කෑ ගහනවා ඇහුණා. සිඟිතිට හරිම දුකයි. දුවගෙන ගිහින් අම්මාටයි තාත්තාටයි කිවුවා.



හැමෝම අඹ ගහ ළඟට ඇවිත් බැලුවා. කුරුලු අම්මා පේන්න හිටියේ නෑ.

කුරුලු පැටවුන්ට බඩගිනි වෙලා වෙන්න ඇති පුතේ තාත්තා කිව්වා.



තාත්තේ අපි කුරුලු ලෑල්ලක් හදමු. එතකොට කුරුලු අම්මයි,තාත්තයි කෑම හොයාගෙන ඈතට යන්නේ නෑනේ කියලා සිඟිති කිවුවා.



සිඟිති තාත්තත් එක්ක එකතුවෙලා කුරුලු ලෑල්ලක් හදන්න පටන්ගත්තා.



සිඟිති කුරුල්ලන්ට කෑම දැම්මා.කුරුල්ලෝ කුරුලු පැටවු එක්ක කුරුලු ලෑල්ලට ආවා. කුරුල්ලෝ සතුටින් කෑම කෑවා.



කුරුල්ලෝ තටු සලමින් සිඟිතිව වට කරගෙන පිංකිට ස්තූති කළා. ඊට පස්සේ හැමදාම කුරුල්ලෝ සිඟිතිගේ කුරුලු ලෑල්ලට ආවා. පිංකි කරපු හොඳ දේට. සිඟිතිගේ අම්මාටයි තාත්තාටයි හරිම සතුටු හිතුණා. සිඟිතිට එදා දවස හරිම සතුටු දවසක් වගේම කිසිම දවසක අමතක නොවන දවසකුත් වුණා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.

මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දූරස්විම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්